# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2087/78 – 2018 සැප්තැම්බර් 06 වැනි බ්‍රහස්පතින්දා – 2018.09.06

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/10/90/2013.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2014.04.11 දිනැති නියෝගයෙන්, බේරුම්කිරීම මගින් විසඳීම සඳහා යොමු කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් පන්නිපිටිය, රුක්මලේ, බාලිකා නිවාස පාර, අංක 213/39 හි පදිංචි බී. ජී. ප්‍රියානි මහත්මිය හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කම්කරු මහලේකම් කාර්යාලය, 1 වන මහලෙහි පිහිටි සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් මා වෙත ලබා දෙන ලද අංක ඒ 3555 දරන ප්‍රදනය 2017. 11. 28 දිනැති හා අංක 2047/20 දරන රජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලදී.

එම ප්‍රදානය සම්බන්ධයෙන් කාර්මික ආරාවුල් පනතේ 34 වගන්තිය යටතේ බේරුම්කරු විසින් මා වෙත ලබා දී ඇති 2018.07.21 දිනැති අර්ථ නිරූපණය එම පනතේ 18 (1) වගන්තිය ප්‍රකාරව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 අගෝස්තු මස 17 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

අර්ථ නිරූපණයක් ලබා දීම

යොමු අංකය: IR/10/90/2013

බී.ජී. ප්‍රියානි මිය., අංක 213/39, බාලිකා නිවාස පාර, රුක්මලේ, පන්නිපිටිය .

ඉල්ලුම්කාරිය (පළමුවන පාර්ශ්වය)

සහ

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, 1 වන මහල, කම්කරු මහලේකම් කාර්යාලය, කොළඹ 05.

වගඋත්තරකරු (දෙවන පාර්ශ්වය)

අතර පවත්නා කාර්මික ආරාවුල පිළිබඳව,

**ප්‍රදනය**

ඉහත සඳහන් නඩුවේ ප්‍රදානය 2017 ජූලි මස 27 වන දින නිකුත් කර ඇති අතර එකී ප්‍රදානය කම්කරු කොමසාරිස් ජනරාල් ඒ. විමලවීර මහතා විසින් 2017 නොවැම්බර් මස 02 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ අංක 2047/20 2017 නොවැම්බර් මස 28 වැනි අඟහරුවාදා රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.

(02) ඒ අනුව බේරුම්කරණ ගොනු අංක ඒ 3555 සඳහා වූ කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්මික සම්බන්ධතා අංශයේ කම්කරු කොමසාරිස් කේ. ඩී. මනෝජ් ප්‍රියන්ත මහතා විසින් 2018.07.11 දිනැති ලිපියෙන් මා අමතමින් එම ප්‍රදානයේ "ඉල්ලුම්කාරියට වී ඇති මූල්‍යමය හානිය" යන්න සම්බන්ධයෙන් නිශ්චිතව ගණනය කරන ලද මුදලක් ඇතුළත් වන පරිදි සුදුසු අර්ථ නිරූපණයක් අප වෙත එවන්නේ නම් බෙහෙවින් කෘතඥ වෙමි. එය රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කිරීමටද අවශ්‍ය බැවින් පිටපත් 5 කින් යුතුව එවන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමියි මා වෙත දන්වා ඇත. එහි පිටපත් නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස්ටද යොමු කර ඇති බැව් සඳහන් වේ.

(03) බේරුම්කරණය ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් දින කිහිපයක් විමසුමක් පවත්වා ඇතත් කේ. ඩී. මනෝජ් ප්‍රියන්ත මහතාගේ ලිපියෙහි සඳහන් පරිදි නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් හෝ වෙනත් නලධාරියෙකු බේරුම්කරණය ඉදිරියට පැමිණ නොමැති බැවින් ද බේරුම්කරණයට කරුණු ඉදිරිපත් කිරීමට සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී එල්. එච්. නිහාල් මහතා විසින් නම් කරන ලද කළමනාකරු (පරිපාලන සහ මානව සම්පත්) බී. සරත් මහතා වෙත බලය පවරන ලද මුත් ඔහුද බේරුම්කරණය ඉදිරියට පැමිණියේ නැත. එබැවින් 2018. 07. 13 වෙනි දින අර්ථනිරූපණ පරීක්ෂණය ප.ව. 2.30 ට ම විසින් අවසන් කරන ලදී.

කම්කරු කොමසාරිස් ජනරාල් ඒ. විමලවීර මහතා විසින් අංක 2047/20 2017 නොවැම්බර් මස 28 වෙනි අඟහරුවාදා අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද ප්‍රදානයේ (Award) 5A ලෙස නම් කරන ලද අවසන් පිටුවේ දැක්වෙන (i), (ii), (iii), (iv) සහ (v) වගන්ති කෙරෙහි කම්කරු කොමසාරිස් ජනරාල්ගේ අවධානය නැවත යොමු කෙරේ.

ඉල්ලුම්කාර පාර්ශවයේ බලයලත් නියෝජිත ජී. ඩබ්ලිව් ග්‍රේෂන් ද සිල්වා මහතාගේ ලිඛිත සැලකිරීම් ලේඛනය X2 ලෙස සලකුණුකර ඇති අතර එම ලේඛනය අනුව ඉල්ලුම්කාරියට ලැබිය යුතු මුදල පහත සඳහන් පරිදි වේ.

ඒ අනුව 2001.10.01 සිට 2017.04.01 දක්වා

| | | රු. ශත |
|---|---|---|
| හිඟ වැටුප | - | 969,270. 00 |
| මාසිකව ලැබෙන දිරි දීමනා හිඟමුදල | - | 306,000. 00 |
| වාර්ෂික ප්‍රසාද දීමනා හිඟ මුදල | - | 152,990. 00 |
| එබැවින් අය විය යුතු මුළු මුදල | - | 1,428,260. 00 |

ඉහත සඳහන් කරුණු අනුව ඉල්ලුම්කාරියට සිදු වී ඇති මූල්‍යමය හානිය හා නියමිත වේලාවට ලැබිය යුතු තනතුරු පමා කිරීමත් එක්කොට ගත් කළ ඉල්ලුම්කාරියට සිදු වී ඇති මූල්‍යමය හානිය අප්‍රමාදව ගෙවිය යුතු බව මාගේ පිළිගැනීමයි. මාගේ ප්‍රදානයේ සඳහන් වන ගණන් බැලීම සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ නිළධාරීන් මැලිකම් දැක්වීමෙන් ඉල්ලුම්කාරියට බලවත් අසාධාරණයක් සිදු වී ඇති බව මට පෙනී යයි. එවැනි අවස්ථාවක මවිසින් පවත්වන ලද අර්ථ නිරූපණ විමසීමේදී ඉල්ලුම්කාරියගේ බලයලත් නියෝජිත ජී. ඩබ්ලිව් ග්‍රේෂන් ද සිල්වා මහතා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ ඇතැම් නිළධාරීන් " බැ, බැ " කියමින් අහක බලන විට ග්‍රේෂන් ද සිල්වා මහතා යුක්තිය සහ සාධාරණය සිතට ගෙන පැමිණිලිකාරිය වෙනුවෙන් සහනයක් දිය හැකි බැව් මා ඉදිරියේ දක්වන ලදී.

බොහෝ දෙපාර්තමේන්තුවල ඇතැම් නිලධාරීන් දැනට අප අතර නැති ටී. බී. ඉලංගරත්න සහ ඇම්. පී. ද සොයිසා යන කම්කරු ඇමතිවරුන්ගේ සේවය අමතක කරමින් එළියට පිටුපා අඳුර දෙසට ගමන් කරන ආකාරය හේතු කොට ගෙන කම්කරු ජනතාවට හානියක් සිදුකරන බැව් මට පෙනී යයි. මේ නිලධාරීන් කළ යුත්තේ අඳුරට පිටුපා එළිය දෙසට ගමන් කිරීමයි. එබැවින් ග්‍රේෂන් ද සිල්වා මහතා විසින් ඉදිරිපත් කරන ලද X2 ලේඛනය සැලකිල්ලට ගෙන ඉල්ලුම්කාරියට ගෙවිය යුතු සම්පූර්ණ හිඟ මුදල වන රු. 1,428,260.00 පැමිණිලිකාරිය වන බී. ජී. ප්‍රියානි මහත්මියට හැකි තරම් ඉක්මනින් ගෙවන ලෙස මෙයින් දන්වමි.

නීතිඥ ටී. පියසෝම,
බේරුම්කරු.

2018 ජූලි මස 21 වැනි දින දී ය.

09 - 576

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.